# බළන්ගොඩ නගර සභාව

## 2021-01-12 දිනැති අඩාලව කල් තබන ලදුව 2021-01-21 දින පවත්වනු ලැබූ

## සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.01.21**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු උප සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-12-14 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව, 2020-12-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, හා 2020-12-24 දින පැවති අඩාලව කල් තබන ලද සභා වාර්තාව සත්‍යය වාර්තාව බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් 2020-12-14 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව, 2020-12-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2020-12-24 දින පැවති අඩාලව කල් තබන ලද සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවල සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් වැඩ ආවරණය කිරීම සඳහා තාවකාලිකව පත්වූ ගරු සභාපතිතුමා වෙත සුභ පැතුම් එක් කරන ලදී. සභා වාර්තාවේ සංශෝධනයන් ලෙස 2020-12-14 දින පවත්වන ලද විශේෂ මහ සභා වාර්තාවේ ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද 2021 වර්ෂයේ අයවැය සම්මතයි යන ප්‍රකාශය සංශෝධනය කිරීම අවශ්‍ය බවද අයවැයක් සම්මත වන ක්‍රම දෙකක් පවතින බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා එනම් යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සම්මත වීම හෝ කවුරුන් හෝ එයට විරුද්ධ වූ විට බෙදීමකට ගොස් එහි බහුතරයෙන් අයවැය සම්මතවීම යන ක්‍රම දෙකෙන් එකක් බව පවසන ලදී. එනිසා අයවැය සම්මතයි යන ප්‍රකාශය පිළිනොගන්නා බවද එය විධිමත් ලෙස සංශෝධනය කරන ලෙස ද ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් නව සභාපතිවරයා වෙත සුභ පැතුම් එක් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් අයවැය සම්මත නොවන බව ප්‍රකාශ කර සිටින බැවින් අයවැය සම්මත වීම හෝ නොවීම පිළිබඳ නීත්‍යානුකූල තත්ත්වය කුමක්දැයි ලේකම්තුමියගෙන් විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ලේකම්තුමියගේ අදහස් විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ඉහත සංශෝධනය සිදු කිරීමට පෙර මේ පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීම අවශ්‍ය බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසූයේ සභාව කර ගෙන යාමේදී ලේකම්තුමියගෙන් හෝ සභාවේ වෙනත් නිළධාරියෙකුගෙන් කරුණු විමසීම සඳහා සභිකයන් හට අවශ්‍ය වේනම් ඒ සඳහා ගරු සභාපතිතුමාගෙන් අවසර ලබාගත යුතු අතර අනතුරුව ගරු සභාපතිතුමන් විසින් සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු බවද එම අවස්ථාවේදී පමණක් නිළධාරීන්ට කථා කළ හැකි බවද පවසන ලදී.

එමෙන්ම අයවැය සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් ගෙන එන ලද සංශෝධනය පිළිගන්නා අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ගැටලුව සඳහා නිශ්චිත පිළිතුරක් ලබාදීමට නොහැකි බව ද ඒ පිළිබඳව ගැටලුවක් පවතින බැවින් ගරු ආණ්ඩුකාරතුමා විසින් නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇති බවද නීතිපති උපදෙස් ලැබුණු පසු අයවැය සම්මතද නැද්ද යන ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය හැකි අතර ඊට පෙර මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය නොහැකි බව ද පවසන ලදී.

02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පෙ.ව.10.12ට සභාව වෙත පැමිණෙන ලදී.

- තමන් අද දින සභාපතිවරයා වශයෙන් මෙම ස්ථානයේ සිටින අතර එක් පැත්තකින් එය සතුටක් වන බව ද එක් දිනක් හෝ නගර සභාවේ සභාපතිවරයෙක් වශයෙන් වාඩිවීමට තමන්ගේ ප්‍රාර්ථනාවක් තිබුණු බව ද එය මෙම ස්ථානයේ සිටින සෑම මහජන නියෝජිතවරයෙකුගේ සිහිනයක් බවද පවසන ලදී. එමෙන්ම තමන් අද දින මෙම තනතුරේ සිටිනුයේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් හිටපු සභාපතිතුමා පළාත් පාලන පනත උල්ලංඝනය කිරීම යන චෝදනාව මත 2020-01-15 වන දිනෙන් පසු සභාපති තනතුරෙන් තාවකාලිකව ඉවත් කර ගැසට් නිවේදනයක් පළ කර ඇති අතර එහිදී ගරු සභාපතිතුමාට ලැබෙන චෝදනා පත්‍රය අනුව ගරු සභාපතිතුමා නිර්දෝශී වුවහොත් නැවත වරක් සභාපති ධූරයට අනිවාර්යයයෙන්ම පත් විය හැකි බවද එහි කිසිඳු ගැටලුවක් නොමැති බවද පවසන ලදී. එමෙන්ම ගරු සභාවේ ගරු උප සභාපති වශයෙන් කවුරුන් සිටියද ගරු සභාපතිතුමාට ගැටලුවක් සිදුවූ විට එහි වගකීම උප සභාපතිතුමාට යන බවද සමහරවිට මෙය තමන්ගේ පළමු හා අවසාන සභාව විය හැකි බවද ඉදිරියේදි සභාපතිවරයෙක් පත්වන්නේ නම් ගරු සභිකයින්ගේ බහුතරයෙන් නව සභාපතිවරයා පත්වන බවද පැවසූ ගරු සභාපතිතුමා තමන් තුළ පක්ෂ භේදයක් නොමැති බවද සෑම මන්ත්‍රීවරයෙක්ම සහෝදර මන්ත්‍රීවරයෙක් ලෙස සලකා කටයුතු කරන බවද තමා සිටින කාලය තුළ බළන්ගොඩ නගර සභා ජනතාව බලාපොරොත්තු වන ඉලක්කය සඳහා ගමන් කිරීමට අවශ්‍ය සහයෝගය හා ආශිර්වාදය ඉල්ලා සිටින බව ද පවසන ලදී. එමෙන්ම තමන් විසින් නගරයේ පිහිටි සෑම විහාරස්ථානයකටම ගොස් ස්වාමීන් වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගත් බවද නගර සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ හා ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය තමන්ට ලැබෙනු ඇති බවට තමන් විශ්වාස කරන බවද පවසන ලදී.

  එමෙන්ම සභාවේ නිළධාරින්ගෙන් ප්‍රශ්නයක් ඇසීමට අවශ්‍ය වන්නේනම් ඒ සඳහා ගරු සභාපතිතුමාගෙන් අවසර ලබා ගත යුතු අතර අනතුරුව ගරු සභාපතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා පෙ.ව.10.15ට සභාව වෙත පැමිණෙන ලදී.

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- පෞද්ගලික බස්ගාල් ගාස්තු හා රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේදී නිවාඩු දිනයන් නිදහස් කර දෙන ලෙස ඉල්ලා අදාළ ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙය ලබන සභා වාරයේ න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කර තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

- එපිටවත්ත මාර්ගයේ 580m දුර ප්‍රමාණයකට ගම්වාසීන්ගේ ඉල්ලීම අනුව නිවාස 30ක් සඳහා පානීය ජලය ලබා දීමට රජයෙන් ප්‍රතිපාදන වෙන් වී ඇති බවද ඒ සඳහා ප්‍රධාන මාර්ගය අයිනේ කාණුව දිගේ ප්‍රධාන මාර්ගයට හානියක් නොවන පරිදි අයකිරීමකින් තොරව කාණුව කැපීමට ජේසීබී යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා එකමුතු සුභසාධක සමිතිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මෙය කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

- බළන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ ඇති ගස්වල අතු විශාල වශයෙන් වැවී ඇති අතර නඩුවලට පැමිණෙන ජනතාවගේ, කාර්ය මණ්ඩලයේ, නීතිඥ මණ්ඩලයේ ආරක්ෂාව සඳහා එම ගස්වල අතු කපා ඉවත් කරන දෙන මෙන් දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්තුමා විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාපති කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් පවසා සිටියේ අධිකරණ භූමියේ ඇති ගස්වල අතු ඉවත් කිරීම සඳහා රු.40,000.00 ක පමණ මුදලක් වැය වන නමුත් උසාවි හරහා මුද්දර ගාස්තු උසාවි දඩ වැනි ආදායම් සභාව වෙත ලැබෙන බවද එබැවින් එම මුදල මුදල් කමිටුව මඟින් අනුමත කර මෙම කාර්යය ඉටු කිරීම සුදුසු බව පවසන ලදී.

- 2020 නොවැම්බර් මස සිට වර්ෂයක කාලයක් දක්වා සභාව සතු දැන්වීම් පුවරු 10 ටෙන්ඩර් ලබා ගත් ටෙන්ඩර් කරු විසින් ඉල්ලීමක් කරමින් පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ දැන්වීම් පුවරු 10 අලෙවිකර ගැනීමට නොහැකි වී ඇති බැවින් ඒ සඳහා සහනයක් ලබා දෙන ලෙස විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් මෙය සාධාරණ ඉල්ලීමක් බැවින් සභාවේ මතය කුමක්දැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා මෙය 2021 වර්ෂයේ ලබාගත් ටෙන්ඩරයක් වන අතර, ඔහු මෙය ලබා ගත්තේ කොවිඩ් 19 වසංගත සමයේ වන බැවින් පවත්නා තත්ත්වය දැනගෙන ලබා ගත් බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 19 වසංගත තත්ත්වය මොහොතින් මොහොත වෙනස්වන බවද සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට නිදහස පවතින බැවින් තම අදහස් ප්‍රකාශ කරන ලෙස ද ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 19 ගැටලුව කවදා අවසන් වෙයිදැයි නොදන්නා අතර ව්‍යාපාරිකයින්ට මෙය බොහෝ සේ බලපාන බවද කොරෝනා වසංගතය සමඟ පීඩා විඳින ව්‍යාපාරිකයෙක් නම් මෙම සහනය ලබාදිය යුතු බවද ඉදිරියේදී ටෙන්ඩර් ලබා ගත් පුද්ගලයන් පමණක් නොව කුලී ගෙවන අයද මෙම සහනය ඉල්ලා සිටින බවද එබැවින් 100% ක් නොව හැකි ලෙස නගර සභාවත් රැක ගෙන දිය හැකි සහනය ලබා දෙන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් මෙම දැන්වීම් පුවරු ලබා ගන්නේ පෞද්ගලික පංති පවත්වන ගුරුවරු වන අතර ඔවුන් විශාල ආදායමක් ලබන බවද මෙම මස 25 වන දින සිට නැවත උපකාරක පංති ආරම්භ වන බැවින් මේ වන විටත් මෙම දැන්වීම් පුවරු භාවිතා කරන බවද එම නිසා මෙම සහනය ලබා දීම අත්‍යවශ්‍ය නොවන බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් රටේ පවත්නා කොවිඩ් 19 ව්‍යාප්තිය පිළිබඳ දැනගෙන ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ලබා ගන්නා බැවින් මේ පිළිබඳව පසුව තීරණයක් ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පෙ.ව.10.27 ට සභාව වෙත පැමිණෙන ලදී.

- බුලත්ගම සුසාන භූමියේ මෘත දේහ භූමදානය සඳහා ඉඩ ප්‍රමාණවත් නොවන හෙයින් උසාවි නියෝගයක් ලබා ගෙන ඩෝසර් කිරීමට සභා අනුමැතිය ලැබුණු අතර එසේ කිරීමට ප්‍රථම ඉඩමේ අයිතිය සභාව නමට පවරා ගැනීම සඳහා ද ඩෝසර් කිරීමට මාස 06 කට පෙර භූමදානය නතර කර වෙනත් සුසාන භූමියක් වෙත යොමු කිරීම සඳහා සහා උපදෙස් පතමින් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

- රිලවුන්ගෙන් ඇති විනාශකාරි තත්ත්වය නිසා තානායමේ නවතා ඇති වාහන වලට හා උලු වහලේ උලු ගලවාගෙන යාම නිසා දැඩි අපහසුතාවයකට පත්ව ඇති බැවින් රිලවුන් පලවා හැරීම සඳහා වායු රයිෆලය ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

## 04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.

මෙදිනට නියමිත මිළ ගණන් විවෘත කිරිම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

මිළ ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

### 04:01 සභාව සඳහා අවශ්‍ය තාර මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිලගණන් විවෘත කිරීම.

සභාව සඳහා අවශ්‍ය තාර මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන හතරකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර එහි අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ බිටුමික්ස් ආයතනය ඉදිරිපත් කර තිබූ රු.15,990.00ක (බැරලයක මිල) මිළ ගණන පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කිරන ලදී.

අනතුරුව ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. කල් දී ඇති යෝජනා

### 05:01 ගරු සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා

**කාරක සභා පත්කිරීම**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ විමලසේන මැතිතුමා පෙ.ව.10.55ට සභාව වෙත පැමිණෙන ලදී.

**05:01:02 මුදල් කමිටුව පත් කිරීම හා බලතල පැවරීම.**

**මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව රුපියල් ලක්ෂ 05ක් දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්ෂ 05 ක් දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු. ලක්ෂ 05 ක් දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය ඝණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රු. ලක්ෂ 05 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම අවස්ථානුකූලව තාක්ෂනික ඇගයීම් කමිටුව පත්කිරීම.නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා වූ මුදල් කමිටුව පත්කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් මුදල් කමිටුව සඳහා ගරු සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා යන අය පත් කිරීම සුදුසු බව යෝජනා කළ අතර මෙහි සංශෝධනයක් සිදු විය යුතු වේ නම් සංශෝධනය කරන ලෙස පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය යෝජනාවක් ඉදිරිපත් කරමින් මුදල් කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලික්ෂා මැතිතුමා සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් මුදල් කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ නම මුදල් කමිටුව සඳහා යෝජනා කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලික්ෂා මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමියගේ නම මුදල් කමිටුව සඳහා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් මේ වන විටත් සභිකවරුන්ගේ නම් විශාල ප්‍රමාණයක් මුදල් කමිටුව සඳහා ඉදිරිපත් වී ඇති බැවින් ගරු සභිකවරුන් 16 දෙනාම මුදල් කමිටුව සඳහා සුදුසු බවට යෝජනාවක් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රු.10,000.00 සිට රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය මුදල් කමිටුව සඳහා ලබා දීම සුදුසු බවට පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් මේ වන විට සභාපති ධූරයේ සිටින එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාපතිත්වය දරණ තාක් කල් පමණක් එසේ රු.10,000.00 සිට රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය මුදල් කමිටුව සඳහා ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් මුදල් කමිටුව සඳහා රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය ලබාදීමට විරුද්ධව යෝජනාවක් ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මේ සඳහා මත දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් මේ සදහා බෙදීමක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව මේ වන විට සභාපති ධූරයේ සිටින එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාපතිත්වය දරණ තාක් රු.10,000.00 සිට රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය මුදල් කමිටුව සඳහා ලබා දීම වෙනුවෙන් මත දෙකක් පළ වූ අතර ඒ සඳහා බෙදීමක් අවශ්‍ය බවට සභාවෙන් යෝජනා ස්ථිර වූ බැවින් එම යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී. එහිදී එම යෝජනාවට පක්ෂව සභිකයින් අට දෙනෙක්ද, එනම්,

01. ගරු සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය
07. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය

මෙහිදී යෝජනාවට විපක්ෂව සභිකයින් හය දෙනෙක්ද, එනම්,
01. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය
06. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

ඡන්දය ලබාදුන් අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ඡන්දය ප්‍රකාශ කිරීමන් වැළකී සිටින ලදී. ඒ අනුව මේ වන විට සභාපති ධූරයේ සිටින එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාපතිත්වය දරණ තාක් රු.10,000.00 සිට රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය මුදල් කමිටුව සඳහා ලබා දීමේ යෝජනාව වැඩි ඡන්ද 02 කින් සම්මත විය.

**05:01:02 කර්මාන්ත කමිටුව**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ කර්මාන්ත කමිටුව පත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් කර්මාන්ත කමිටුව සඳහා පහත නම් සඳහන් සභිකවරුන් සුදුසු බවට යෝජනා කරන ලදී.

01. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

| | |
|---|---|
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් කර්මාන්ත කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එමෙන්ම කර්මාන්ත කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් යෝජනාවක් ගෙන එන ලදී. ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා කර්මාන්ත කමිටුව සඳහා සුදුසු බවට යෝජනා කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය කර්මාන්ත කමිටුව සඳහා සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.
කර්මාන්ත කමිටුවේ සභාපති වශයෙන් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඒ අනුව 2021 වර්ෂයේ කර්මාන්ත කමිටුව ලෙස පහත සඳහන් සභිකවරුන් පත් කරන ලදී.

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රීනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 08. ගරු නාගරික මන්ත්‍රීනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 09. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය |

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා වූ පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කරමින් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව සඳහා පහත සඳහන් සභිකවරුන් සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් පරිසර සෞඛ්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ සභාපති වශයෙන් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා මෙම කමිටුව සඳහා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2021 වර්ෂයේ පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව ලෙස පහත සඳහන් සභිකවරුන් පත් කරන ලදී.

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රීනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |

එමෙන්ම පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවෙහි ප්‍රජා නියොජනය ලෙස 2020 වර්ෂයේ මෙම කමිටුව නියෝජනය කළ පහත සඳහන් පුද්ගලයින් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

1. කේ. දයානි වීරසිංහ මිය
2. අශෝකා රත්නායක මිය
3. එච්.එම්.ෂියානා මිය
4. සුමනා වීරකොන් මිය.
5. එච්.ජේ. කුසුමා ජයසුන්දර මිය
6. ප්‍රියංකා ඒකනායක මිය

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබාගැනීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම,ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන

අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කරමින් පුස්තකාල උපදේශන කමිටුව සඳහා ගරු පහත සඳහන් සභිකවරුන් සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| | |
|---|---|
| 01. ගරු සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රීනී | එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලික්ෂා මැතිතුමා තමන් පුස්තකාල කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය සුදුසු බවට එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් තමන් නිල බලයෙන් පුස්තකාල උපදේශන කමිටුවේ සභාපතිවන නමුත් තමන්ගේ එම බලතල ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා වෙත පවරන බව පවසන ලදී.

ඒ අනුව 2021 වර්ෂයේ පුස්තකාල උපදේශන කමිටුව ලෙස පහත සඳහන් සභිකවරුන් තෝරාපත්කර ගන්නා ලදී.

| | |
|---|---|
| 01. ගරු සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රීනී | එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය |

එමෙන්ම පුස්තකාල උපදේශන කමිටුවෙහි ප්‍රජා නියොජනය ලෙස 2020 වර්ෂයේ මෙම කමිටුව නියෝජනය කළ පහත සඳහන් පුද්ගලයින් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

1. ටී. එම්. නෙයිසූර් මිය
2. ධර්මසේන සමරසිංහ මයා
3. එච්. ඒ. බී. අයි. සිරිවර්ධන මයා
4. එම්. පී. එස්. ඩී. නාවනැල්ල මයා
5. ඉන්ද්‍රානි වීරසේකර මිය
6. අනිල් අල්විස් මයා
7. එම්. ජෙයරාජන් මයා
8. කුසුමා අබේසිංහ මිය
9. ඒ. එල්. අක්බර් අලී මයා
10. ඉන්ද්‍රානි එස්. රත්නායක මිය
11. දයානන්ද බෙනරගම මයා

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:05 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම
ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සංවර්ධන උපදේශන කමිටුව සඳහා සභාවේ ගරු සභිකවරුන් සියලු දෙනා පත්කළ යුතු බව පවසන ලදී. ඒ අනුව ගරු සභාවේ සභිකවරුන් සියලු දෙනා සංවර්ධන උපදේශන කමිටුව සඳහා සුදුසු බවට ගරු සභාපතිතුමා සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| | |
|---|---|
| 1. ගරු සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |

| | |
|---|---|
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

එමෙන්ම සංවර්ධන උපදේශන කමිටුවෙහි ප්‍රජා නියොජනය ලෙස 2020 වර්ෂයේ මෙම කමිටුව නියෝජනය කළ පහත සඳහන් පුද්ගලයින් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

1. ගරු පූජ්‍ය මෛත්‍රීමූර්ති ස්වාමීන් වහන්සේ
2. ගරු පූජ්‍ය පියනන්ද ස්වාමීන් වහන්සේ
3. ගරු පූජ්‍ය කඳන්ගොඩ සද්ධානන්ද ස්වාමීන් වහන්සේ
4. මුස්ලම් ප්‍රධාන පල්ලියේ පූජකතුමා
5. බළන්ගොඩ නගර සභාවේ හිටපු ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මහතා
6. විශ්‍රාමික විදුහල්පති එම්. ජෙයරාජන් මහතා
7. ආර්. කේ. ඩී. ජයසිංහ මහතා
8. ෆාරුෆ් හාජියාර් මහතා
9. බී. එම්. ගුණතිලක මහතා
10. විල්ෆ්‍රඩ් සිසිල් මහතා
11. හර්ෂන හෙට්ටිආරච්චි මහතා
12. ග්‍රාම නිලධාරිනි චන්ද්‍රා පැලවත්ත මහත්මිය
13. නිහාල් ෆොන්සේකා මයා
14. නිල්මිණි වනසේකර මිය
15. ඉන්ද්‍රානි රත්නායක මහත්මිය

16. මාග්‍රට් පෙරේරා මිය

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ06 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව**

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, එම්.ටී.එම්.එම්.රුමී මැතිතුමා
1. ලේකම්, එස්.එච්.ඒ.කරුණාරත්න
2. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
3. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
4. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
5. පුස්තකාලාධිපතිනි, අනුලා කහංගම මිය
6. මහජන සෞඛ්‍ය පරීක්ෂක, ඒ.එම්.සී.එල්.ආඳාදොළ මයා
7. පෙර පාසල් පාලිකා, ඩබ්.එම්.සෙව්වන්දි සමන්මලී වීරසිංහ මිය
8. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ07** ටෙන්ඩර් මණ්ඩලය ලෙස පත් කර ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් සභාවේ සියලුම සභිකවරුන් පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා මීට දින කිහිපයකට පෙර ගිය අවස්ථාවේදී එහි තිබූ ගැටලු රාශියක් දුටු බවද 2001 වර්ෂයේ එවකට සභාපතිව සිටි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් එය ආරම්භ

කළ අතර එය ආරම්භ කර වසර 20 ක් පමණ වන බවද මෙලෙස පවත්වාගෙන ගියහොත් තවත් වසර එක හමාරකට වඩා කාලයක් කරගෙන යාමට නොහැකි බවද එය අධීක්ෂණය කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා හා ලේකම්තුමිය සහභාගී වූ බවද එම අවස්ථාවේදී හැකි ඉක්මනින් මෙය අලුත්වැඩියා කටයුතු කළ යුතු බව නිරීක්ෂණය වූ බවද නගරයේ වෙනත් සංවර්ධනයන්ට වඩා මෙය සංවර්ධනය කිරීම ප්‍රමුඛ බවද පවසන ලදී. ඒ සඳහා ඉක්මනින් විසඳුමක් ලබා ගත යුතු අතර ඉන්සියුලේටරයක් ලබා ගත යුතු බවද ගම්පොළ නගර සභාවේ සහ කුරුණෑගල රෝහලේ ඉන්සියුලේටරයක් පවතින බවද මේ සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමාට අවස්ථා ලබා දෙන බව ද පැවසීය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් ඒ පිළිබඳව ස්තුතිය පළ කළ අතර එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවද තමන් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවෙන් ඉල්ලා අස්වන බවද ස්වාධීනව සිටින බවද ඒ වෙනුවට වෙනත් කෙනෙකුන් පත් කර ගන්නා ලෙසද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා බැංකියවත්ත කොම්පොස්ට් ව්‍යාපෘතිය අයත් කොට්ඨාශය භාරව සිටින මන්ත්‍රීවරයා වන්නේ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා බවද කොට්ඨාශය භාර මන්ත්‍රීවරයා ලෙස එහි පවතින ගැටලු හඳුනාගත හැක්කේ එතුමාට බවද එම ප්‍රදේශයේ ජනතාව සමඟ දැඩිව සම්බන්ධතාවයක් පවතින බැවින් එතුමාට එම මූලිකත්වය ලබා දුන් බවද මේ පිළිබඳව හොඳ සංකල්පයක් එතුමාට පවතින බැවින් හොඳින් වැඩකළ හැකි බවද මෙය පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ සභාපති වන ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට විරුද්ධව කථා කිරීමක් නොවන බවද අත්දැකීමක් තිබෙන මන්ත්‍රීවරයෙකු මෙම කමිටුව තුළ සිටීම තුළින් එම කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට හැකිවන බවද පැවසීය. එමෙන්ම ගමේ ගැටලුව ජනතාව පවසන්නේ ගමේ මන්ත්‍රීතුමාට බව ද කොම්පෝස්ට් ව්‍යාපෘතිය කඩා වැටුණහොත් මුළු බලන්ගොඩ නගරයම කුණු ගොඩක් බවට පත්වන බැවින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරක්ෂා කළ යුතු බවද එය තවත් වසර එක හමාරක් පමණ කරගෙන යාමට හැකි තත්ත්වයේ පවතින බැවින් ඉක්මනින් අලුත්වැඩියා කළ යුතු බවද එම නිසා තම ඉල්ලීම පරිදි ඒ සම්බන්ධව පැහැදිලි කරන ලෙස ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, තමන් ඇතුළු පිරිස එම ස්ථානය නිරීක්ෂණයට ගිය බවද හිටපු සභාපතිතුමා විසින් මෙම කොම්පොස්ට් ව්‍යාපෘතිය සාර්ථකව කරගෙන ගිය බවද එබැවින් ලංකාවේ අග්‍රගණයේ පළාත් පාලන ආයතනයක් බවට පත්වූ බවද තමන්ගේ කොට්ඨාශය තුළ කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිහිටා ඇති අතර තමන් චමික වැවේගෙදර මැතිතුමා සභාපතිව සිටින සමයේදී කොම්පෝස්ට් ව්‍යාපෘතිය නගරයේ හදවත බව පවසා සිටි බව ද පැවසීය. එමෙන්ම නගර සභාවේ පළමු කාර්යය වන්නේ සෞඛ්‍ය සුරක්ෂිතතාවය වන අතර නගරය පිරිසිදුව පවත්වාගෙන යා යුතු නමුත් ඇතැමුන්ට මෙය නොතේරෙන බවද වගකීමෙන් අවධානයෙන් හා දැනුම එකතු කරමින් සිටින බවද කැළි කසළ වැසිකිළි අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් ආදී නොදිරන ද්‍රව්‍ය ලෙස කොටස් තුනකින් යුක්ත බව ද

පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා පළවෙනි අදියර ලෙස ප්ලාස්ටික් තොගය සඳහා පිළියමක් වශයෙන් ඉන්සියුලේටරය ගෙන ආ යුතු බවද ලෝකයේ බොහෝ තැන්වල පරිසර දූෂණය පිළිබඳ කථා කරන අතර කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පිළිස්සුම් දාහකයක් තිබිය යුතු බවද පැවසීය. රජය විසින් කසළ කළමණාකරණය සඳහා විශාල මුදලක් වෙන් කර ඇති අතර එයට අවශ්‍ය යෝජනා අදහස් හා මැදිහත්වීම් කොට්ඨාශ භාර මන්ත්‍රීවරයා ලෙස තමන් කරන බවද එබැවින් එම කාර්යයන් ඉටු කිරීම කළ යුතු බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තමන් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස පත් කිරීමට කටයුතු කළ මන්ත්‍රීවරුන් දෙපළ සඳහා ස්තුතිය පළ කරන බව පැවසූ අතර, ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා පත්කර ගැනීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා තමන් එය ප්‍රතික්ෂේප කරන බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අප තුළ පවත්නා සම්පත් උපරිම ලෙස භාවිතා කරමින් මෙය ඉටු කරගෙන ගිය බවද තමන් ඉන්සියුලේටරයක් බේල් මැෂින් එකක් හා එම ස්ථානයට ගෙන එන කසල ඇඹරීමට අවශ්‍ය මැෂින් මෙම වසර තුළ ගැනීමට තමන්ගේ අදහසක් තිබූ බවද ඉන්සියුලේටරයට වඩා බේල් මැෂින් එකක් ගැනීම වටින බවද ඉන්සියුලේටරය සඳහා වියදමක් පමණක් දැරීමට සිදු වන බවද මිලියන 20 ක් 25 ක් පමණ මුදලක් මේ සඳහා වියදම් වන බව ද පවසන ලදී. බේල් මැෂින් එක සඳහා ද එවැනි මුදලක් වැයවන නමුත් බේල් කරන ලද කසළ කොටස් බැම් ඉදි කිරීමට, නාය යන ස්ථානවලට යෙදීම වැනි සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි බවද විකිණීම සිදු කළ හැකි බවද එමඟින් ඒ සදහා යන වියදම යම් ප්‍රමාණයකින් හෝ ආවරණය කර ගත හැකි බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ විමලසේන මැතිතුමා කසළ අඹරන මැෂින් එකක් ගැනීම ඒ අතරින් ප්‍රමුඛ වන බවද එමඟින් පොහොර සෑදීම වේගවත් වන බවද කුණු කසළ වලින් 40%ක් පමණ කොම්පෝස්ට් පොහොර සකස් කිරීමට යොදා ගන්නා අතර ඉතිරි 60%න් 45% ක් හෝ කසළ අඹරන මැෂිම මඟින් සකස් කර ගත හැකි බවද අනතුරුව ඉතිරි ප්‍රමාණය බේල් මැෂිම හරහා බේල් කිරීමට හැකියාවක් පවතින බවද සභාවේ මන්ත්‍රීවරුන් මේ පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතු බවද පැවසීය.

එමෙන්ම තමන් මුදල් කමිටුසඳහා ලක්ෂ 05 ක බලය ලබා දීම විරුද්ධ බවට ප්‍රකාශ කළේ මාස තුනක් පමණක් නොව මෙම සභාවේ සංවර්ධන කටයුතු වසර පුරාම සිදු වන නිසා බව ද වසරක් සඳහා ජනතාවගෙන් බදු මුදල් අය කර මාස තුනක් පමණක් එම ජනතාව වෙනුවෙන් සේවය ඉටු කිරීම පිළිබඳ සභාවක් වශයෙන් ලැජ්ජා විය යුතු බවද කවුරුන් සභාපති වශයෙන් සිටියද අයවැයක් සකස් කරනුයේ වර්ෂයක් සඳහා වන බැවින් වසරක් පුරාවට මහජනතාව වෙනුවෙන් සේවය කල යුතු බවද බදු ගෙවන මහජනතාවට ඔවුන්ගේ සේවය මාස තුනකට ලඝු

කිරීම වෙනුවෙන් තමන්ගේ විරෝධය පළ කරන නමුත් එම විරෝධය මුදල් කමිටුවට පළ කිරීමක් නොවන බව ද පැවසීය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ ගරු සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් තම සභාපතිත්වය ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා වෙත පරිත්‍යාග කළ බැවින් හිතේ කහටක් නොමැතිව එය භාර ගන්නා ලෙස පවසන ලදී.
ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් මැතිතුමා සභාපතිත්වය වෙනුවෙන් ස්ථිර කළේ තමා නිසා එය ඉල්ලා අස්කර ගෙන මෙතුමා සභාපති වීමේ යෝජනාව ස්ථිර කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින් තමන් එය ප්‍රතික්ෂේප කරන බවද නදීශාන් මැතිතුමාට කළ හැකි උපරිම සහයෝගය ලබා දෙන බවද පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ ඉදිරියේදී සෞඛ්‍ය කමිටුවේ දී මෙම තීරණය ලබා ගැනීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් තමන් නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේ සභාපති වශයෙන් ගෙන ආ යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ විමලසේන මැතිතුමා පෙ.ව.11.16 ට මවගේ අසනීප තත්ත්වය හේතුවෙන් සභාවෙන් පිටවන ලදී.

05:01:08 බැංකියවත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පොලිතීන් උරය සමග මුද්‍රිත පොහොර කවර 10 Kg, 25Kg, 50Kg ලෙස 3000 ක් මිළදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.
ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:09 කාර්යාලයට අවශ්‍ය ජෙනරේටරයක් මිළදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත සඳහන් සාමාජිකයින් පත්කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| විදුලි ඉංජිනේරු | - | ඩබ්.එම්.කේ.ඊ.වීරසිංහ මයා |
| බළන්ගොඩ නගර සභාවේ ගණකාධිකාරි | - | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා |

වැඩ අධිකාරි - පී.ඩබ්.එස්.සේනාධීර මයා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:10** සෞඛ්‍ය අංශයේ අත් කරත්තවල රෝද පිත්තල බුෂ් ගසා අලුත්වැඩියා කිරීම සඳහා හේෂාන් මෝටර්ස් ඇන්ඩ් ඉංජිනියරින් ආයතනයේ කරත්ත හතරක රෝද 8 ක් මිළදී ගැනීම සඳහා රු.16,000.00 ක මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:11** කාර්යාලයේ පරිගණක හා යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම් (වාහන හැර) සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ගණකාධිකාරි වැඩ අධිකාරි තාක්ෂණ නිළධාරි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර යන අය පත් කර ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:12** රජරට විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ ගිණුම්කරණ හා මූල්‍ය දෙපාර්තමේන්තුවේ අවසන් වසර ඉගෙනුම ලබන නිපුනි අනුත්තරා වන අය සඳහා මාස 06 ක සීමාවාසික පුහුණුවක් මෙම ආයතනයෙන් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:13** කසළ කළමනාකරනය සඳහා (Single Cab) මිනි ට්‍රක් එකක් මිළදී සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

මේ පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.
මේ පිළිබඳ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

**05ඃ01ඃ14** මොහාන් සාලිය එල්ලාවල මාවතේ සිදු කිරීමට නියමිත Street Light ව්‍යාපෘතිය ලංකා විදුලි බල මණ්ඩලය හා ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 100 ක පමණ මුදලක් වැය වන බැවින් මේ සඳහා සුදුසුම ක්‍රමවේදය වන්නේ බස්නැවතුම්පලෙහි සෝලා පවර් එකක් සවි කිරිම බව පවසන ලදී.

මේ පිළිබඳව ඉදිරියේ දී සභාවේ සියලු දෙනා එක්ව තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

**05ඃ01ඃ15** රු.10,000.00ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020-12-04 | ප්‍රසංග ෂොපින් සෙන්ටර් - ආයුර්වේද වෛද්‍ය සඳහා නිල ඇඳුම් රෙදි හා විෂබීජහරණය සඳහා පොලිතීන්,බැංකියවත්ත සඳහා කර්ටන් රෙදි මිලදී ගැනීම. | 33 | 040654 | 10012.50 |
| | ලංකා විදුලිබල මණ්ඩලය - 2020 නොවැම්බර් සම්පත් පියස, බැංකියවත්ත I,II, බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතීන් මධ්‍යස්තානය විදුලි බිල්පත් පියවීම. | 41 | 040662 | 15485.25 |
| | පී එම් කේ හාඩ්වෙයාර් - බැංකියවත්ත කාර්යාලය ජල සැපයුම කටයුතු හා සුළු අලුත්වැඩියා සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම. | 46 | 040664 | 15525.00 |
| 2020-12-07 | සුභසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය - පුවක්ගහමුල්ල පාරේ මහේෂ් නිමන්ත මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 54 | 040671 | 29483.71 |
| | සුභසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය - මහජන බැංකුව අසල නිර්මාණය කිරීමට යෝජිත බිතු කැටයම සඳහා වන තාප්පය ඉදි කිරීම කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 55 | 040672 | 240000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2020-12-10 | කසල තේරීම - 2020 නොවැම්බර් මාසය | 63-22 | 040679 | 48100.00 |
| | මෝටර්ග්‍රේඩර් යන්ත්‍ර ක්‍රියාකරු - කර්මාන්ත- 2020 නොවැම්බර් මාසය | 63-23 | 040679 | 22800.00 |
| | පොලිතින් තේරීම - 2020 නොවැම්බර් මාසය | 63-24 | 040679 | 70850.00 |
| | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරී කිරීම වෙනුවෙන් ගෙවීම - 2020 නොවැම්බර් මාසය | 63-25 | 040679 | 11700.00 |
| | දෛනික කම්කරු /මේසන් වැටුප් කර්මාන්ත අංශය - 2020 නොවැම්බර් මාසය | 63-26 | 040679 | 131300.00 |
| 2020-12-15 | ලංකා විදුලිබල මණ්ඩලය - 2020 නොවැම්බර් මස බස් නැවතුම්පොළ විදුලි බිල්පත් ගෙවීම | 70 | 040606 | 32185.20 |
| | බී. කේ. ජේ. එස්. අමරදාස වෙත 2020-10-22 සිට 2020-10- 31 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 73 | 040609 | 52252.21 |
| 2020-12-21 | සුභසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - කිවුලේවෙල මස්සැන්න මාර්ගය යා කෙරෙන පාලම ඉදිකිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 111 | 040627 | 72337.33 |
| | බළන්ගොඩ නගර වසම එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - බළන්ගොඩ හැටන් නැෂනල් බැංකුව අසලින් දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 112 | 040628 | 45000.00 |
| 2020-12-22 | සමස්ත ලංකා වැඩිහිටි සමිතිය - ඕළුගංතොට මඩේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 116 | 048276 | 454000.90 |
| 2020-12-31 | රොබට් ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ් - ශබ්ද විකාශන යන්ත්‍රය සඳහා අහුජා 20 ස්පීකර් සෙට් එකක් මිලදී ගැනීම. | 133 | 048299 | 20643.50 |
| | බුලත්ගම එක්සත් මිතුරු සංසදය - දෙනියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර ඉතිරි කොටසපැතිබැම්ම සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 138 | 048304 | 67800.00 |
| ලංකා බැංකු ගිණුම | | | | |
| 2020-12-16 | බී.විනෝදනී ප්‍රේමිකා - 2020-12-01 සිට 2020-12-15 දක්වා නගරය පවිත්‍ර කිරීමේ ටෙන්ඩරය වෙනුවෙන් ගෙවීම | 01 | 398980 | 320050.50 |
| 2020-12-22 | ලංකා විදුලිබල මණ්ඩලය - 2020 දෙසැම්බර් මස කාර්යාලය, යාබද ගොඩනැගිල්ල, හෝරා ස්ථම්භය විදුලි බිල්පත් පියවීම | 03 | 398981 | 36637.95 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2020 නොවැම්බර් මස බස්නැවතුම්පල ජල බිල්පත් ගෙවීම | 05 | 398982 | 50979.60 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2020 නොවැම්බර් මස පොදුවෙළඳසැල, මහජන පොළ, දොරවෙල ගබඩාව ජල බිල්පත් ගෙවීම | 06 | 398982 | 29564.23 |
| 2020-12-24 | සුහද වැඩිහිටි සමිතිය - වතුකාරගොඩ වෙල කොටසේ පැතිබැම්ම සංවර්ධනය කිරීම කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 08 | 398983 | 670000.00 |
| 2020-12-28 | Dialog Broadband Networks pvt ltd | 10 | 398985 | 32487.80 |
| | විකසිත එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් | 18 | 398992 | 10,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | සුභසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - කිවුලේවෙල කොන්ක්‍රීට් කාණුවේ ඉතිරි කොටස ඉදිකිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 19 | 398993 | 15000.00 |
| | සුභසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - කිවුලේවෙල කොන්ක්‍රීට් පාලමේ ඉතිරි කොටස ඉදිකිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පතු ගෙවීම | 20 | 398993 | 21850.00 |
| 2020-12-30 | හුණුකුඹුර ජලබල එකමුතු සුභසාධක සමිතිය - හුණුකුඹුර ගාලවත්ත සරත් කුමාරසිරි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 34 | 398001 | 225,000.00 |
| | ඊ.ඩබ්.එල්.කේ.අල්විස් - තානායම පිවිසුම අසල බිත්තිකැටයම නිර්මාණය කිරීමේ කර්මාන්තය 20% අත්තිකාරමක් ලබා ගැනීම | 43 | 399005 | 38000.00 |
| | බෝවත්ත විවේකාරාම වැඩිහිටි සමිතිය - කරව්කැටිය ගල්වල පාර පැති කාණුව ඉදිකිරීම 2 අදියර කර්මාන්තයේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 44 | 399006 | 125,267.83 |

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම ගෙවීම් තුළ මෝටර් ග්‍රේඩර් රියදුරු වෙනුවෙන් රු.22,800.00 ක මුදලක් ගෙවා ඇති බැවින් ඒ කුමක් සඳහා ද යන්නත් මෙහි රියදුරු කවුරුන්ද යන්නත් විමසන ලදී.

මේ පිළිබඳ වැඩ අධිකාරිතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.
වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ඉන් අනතුරුව මෙම ගෙවීම අනුමත නොකිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:16** කැලුම් ප්‍රියන්ත මහතා විසින් කේ.කේ.මිල්ටන් ජයකොඩි මහතාගේ ඉඩම් කොටස මිළදී ගත් බැවින් බළන්ගොඩ නගර සභාවේ ලේඛනවල නම සංශෝධනය කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:17 ආයුර්වේදය සඳහා ප්‍රෙෂර් මීටරයක් මිළදී ගැනීම සඳහා Unique Pharmacy විසින් ඉදිරිපත් කර ඇති රු.28,200.00 ක මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:18 ZA-5039 JCB යන්ත්‍රය සඳහා වම්පස වීදුරු ලබා ගැනීමට FOTON නියෝජිත ආයතනයක් වන AVONSMART ආයතනය මගින් ඉදිරිපත් කර ඇති රු.65,880.00 ක මිළ ගණන සඳහා අනුමැතිය ලබා ගැනීම මෙහි වම්පස වීදුරුව රැගෙන ඒම සඳහා හා සවිකිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.12,500.00 ක මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:19 බොබ් කැට් යන්ත්‍රය මීටර් පැය 10000ක් පූර්ණ සේවා කිරීම සඳහා C-Com Equipment (Pvt) Ltd නියෝජිත ආයතනයෙන් ලබා ගත් රු.196,409.88 මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:20 **KW** 1639 ට්‍රේලරය අලුත්වැඩියා කිරීම සඳහා පහත සඳහන් අමතර කොටස් ලබා ගැනීම සඳහා P.M.K හාඩ්වෙයාර් වෙතින් ඉදිරිපත් කර ඇති රු 10, 625.00 ක මිල ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | | |
|---|---|---|---|
| 1 ½”x3’’x2” mm Box Bar | - | 01 | -Rs.3975.00 |
| 4” Cutting Wheel | - | 25 | Rs.2750.00 |
| දොර අල්ලු 1”x3” | - | 06 | Rs.3900.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ21** 56-1906 කෘෘ කැබ් රථය සඳහා 90 Amp Lucas වර්ගයේ බැටරියක් ලබා ගැනීම සඳහා චමින්ද බැටරි මාට් වෙතින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති රු.19,642.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ22** RC-1107 ට්‍රැක්ටර් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- ස්ටාටර් මෝටරය
- එන්ජිමේ තෙල් කාන්දුවක් වීම.
- ට්‍රේලරයේ හයිඩ්‍රොලික් හෝස් එක
- ඉදිරිපස එන්ජිම කොටසේ තීන්ත ආලේප කිරීම
- ටේලරයේ ඇක්සල් රේසර්
- රියදුරු අසුන

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ23** 227-5020 ගලි බවුසරයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ඉදිරිපස රෝද පැත්තකට ගෙවීම
- තිරිංග පලු
- ඉදිරිපස දුනු බුෂ්
- මඩ කාපට්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:24** HF 7899 JCB යන්ත්‍රය සඳහා ටර්බෝ යුනිට් (තුර්කි) එකක් ලබා ගැනීමට ලීල් මෝටර්ස් වෙතින් ලබා දී ඇති රු.95,000.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:25 පැරණි පොදු වෙළෙඳසැල ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:26 රථ ගාල් වර්ග කර සකස් කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:27** නගර සීමාවේ තෝරාගත් ස්ථානයන්හි 20X10 ප්‍රමාණයේ දැන්වීම් පුවරු ඇති කිරීම (ආදායම් උත්පාදනය සඳහා)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:28** විදුලි ආලෝකය නොමැති මොහාන් සාලිය එල්ලාවල මාවත සූර්ය කෝෂ මඟින් ආලෝකමත් කිරීම (විදුලි බල මණ්ඩලයේ සැපයුම් ලබාගෙන ඔවුන් සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:29** තුරු උයන සංවර්ධනය කර හෙල බොජුන් හලක් වැසිකිළි පද්ධතියක් සහිතව විවේක ස්ථානයක් බවට පත් කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:30** සුගතදාස මහතාගේ නිවාස මාර්ගය පැතිබැම්ම යොදා මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:31** පල්ලෙකුඹුර 1 වන පටුමඟ තාරයොදා සංවර්ධනය කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් ඉහත සඳහන් යෝජනාවලින් සංවර්ධන යෝජනා හැර ඉතිරි යෝජනා සියල්ල අනුමත කරන ලෙස පවසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමාගේ යෝජනා අතරින් සංවර්ධන යෝජනා හැර ඉතිරි යෝජනා සියල්ල සභාවේ අනුමත කරන බවට එය ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් මෙම වසරේ ඉටු කිරීමට බලාපොරොත්තු වනුයේ අයවැය ලේඛනය තුල අන්තර්ගත වී ඇති සංවර්ධන යෝජනා පමණක් වන අතර එය මේ වන විට නීතිපති මතය ලබා ගැනීමට යොමු කර ඇති බව ද එම උපදෙස් ලැබෙන තෙක් සංවර්ධනය කිරීමට හැකියාවක් නොමැති බවද පුනරාවර්තන වියදම් අලුත්වැඩියා හා නඩත්තු, සේවක නඩත්තු සිදු කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බවද සංවර්ධන කටයුතු ඉටු කිරීමට නම් අයවැය සම්මත වීම අනිවාර්යය බවද

පවසන ලදී. එබැවින් ගරු මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන යෝජනා සාකච්ඡා කිරීම තේරුමක් නොමැති බවද සියලු යෝජනා අනුමත කර තබා ගෙන අයවැය සම්මත වූ බවට නිතීපති මතය ලැබුණු පසු ඉටු කිරීම සුදුසු බව ද පවසන ලදී.

එබැවින් මන්ත්‍රී යෝජනා සියල්ල ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජීපේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

06. මන්ත්‍රී යෝජනා

**06ඃ01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

**06ඃ01ඃ01** මින් පෙර මා විසින් යෝජනා කරන ලද පොළ කඩ 20 ට අමතරව ඉතිරි කඩ අවශ්‍ය වෙළෙඳුන්ට ලබා දී එම වෙළෙඳසැල්වලට විදුලි ලබා දීම.

**06ඃ01ඃ02** බාන්ස් රත්වත්ත මාවතේ සිට සේනක පෙදෙස දක්වා අලුතින් තැනූ මාර්ගය මැද ඇති සපු ගස කපා ඉවත් කර එම මාර්ගය සංවර්ධනය කිරීම.

**06ඃ01ඃ03** කර්මාන්ත කමිටුවේදී සම්මත වූ සේනක පෙදෙසේ මාර්ගය අයිනේ තැනීමට ඇති හඳුනාගත් බැම්ම සාදා දීම

**06ඃ01ඃ04** කොටුගොඩැල්ල මාර්ගයෙන් බලකොටුව පාරට හැරෙන හන්දිය ක්‍රමවත් කොට සංවර්ධනය කිරිම.

**06ඃ01ඃ05** නගරයේ කිහිපතැනකම පදික වේදිකාවේ කොන්ක්‍රීට් තහඩු අඩුතැන් සම්පූර්ණ කර අඩුපාඩු සාදා ක්‍රමවත් කර දීම.(උසාවිය අසළ)

**06ඃ01ඃ06** නගර සභාවට අයිති ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය භාවිතා කරන නව බස්නැවතුම්පළේ ඉංජිනේරු සේවා ස්ථානය අසළ ඇති පේමන්ට් ගැට්ට ඉවත් කර දුර ගමන් සේවා බස්රථ සඳහා පහසුකම් සැලසීම (මෙය ඩිපෝ අධිකාරිතුමාගේ ඉල්ලීමකි)

**06ඃ01ඃ07** කරවිකැටිය වට රවුම් පාර මුල නගර සභාව අසළ බෝක්කුව ක්‍රමානුකුලව සකසා වටරවුම්පාර මුල පුළුල් කොට සී.සී.දෙමල විද්‍යාලය දක්වා මාර්ගයේ එක් පැත්තක් කාණුව උඩට කොන්ක්‍රීට් තහඩු ආවරණය යෙදීම.

**06ඃ02 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

06ඃ02ඃ01 කුමාරගම තුන්වන පටුමඟ මාර්ගය හා කාණු පද්ධතිය සකස් කිරීම

**06ඃ03 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

06ඃ03ඃ01 පොදු වෙළෙඳසැල සංවර්ධනය කිරීම

**06ඃ04 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

06ඃ04ඃ01 විදුලිබල මණ්ඩලය ඉදිරිපිට ඉහළ කොටස පැති බැම් බැඳ කාණු යොදා සංවර්ධනය කිරීම.

06෴04෴02 2020 දෙසැම්බර් 16 වන දින පැවති බළන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවේ යෝජනා ස්ථිරත්වයෙන් ගත් තීරණය අනුව බැංකියවත්ත ප්‍රදේශවාසීන්ට ජලය ලබා ගැනීම සඳහා ජල නල ලබා දීමට තීරණය විය. එම අවස්ථාවේ සභාපතිතුමන් හා ලේකම්තුමිය ද අප මන්ත්‍රීවරුන් ද සිටි බවත් ඒ සඳහා අවශ්‍ය රු. 300,000.00 ක ඇස්තමේන්තුවක් ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා ගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටීම

**06෴05 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

06෴05෴01 දොරවෙල සුනිල් මහතාගේ නිවස හා අනෙකුත් නිවස සඳහා යන මාර්ගය පැති බැම් හා කාණු යොදා සංවර්ධනය කිරීම.

**06෴06 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා**

06෴06෴01 බළන්ගොඩ ෆලීල් හාජ්ජියාර් මාවත උඩ කොටස සුලයිමාන් මහතාගේ නිවසට යන පාර තාර දමා සංවර්ධනය කිරීම.

**06෴07 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

06෴07෴01 ඇල්ලඅරාව එක්සත් මාවතට පානීය ජලය ලබා දීම

**06෴08 ගරු නාගරික එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

06෴08෴01 කොටුගොඩැල්ල ජනකලා නිවාස වෙත පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම.

**06෴09 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

06෴09෴01 ඕලුගංතොට සෙලෝවත්ත මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

**06.10 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

06෴10෴01 දොරවෙල මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

**06෴11 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

06෴11෴01 නගරයේ සිට මුගුණමලය දක්වා ඇති පාලම ජනතාව වෙනුවෙන් ඉදිකරදීම.

**06෴12 ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

06෴12෴01 බළන්ගොඩ උඩ ඇල්ලෙපොළ මූකලන්වත්ත මාර්ගය පැති බැම් යොදා සංවර්ධනය කිරීම

**06෴13 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

06෴13෴01 කුමාරගම පිරිවෙන මාර්ගයේ ඉහළ කොටස සංවර්ධනය කර පැති කාණුව යොදා ඒ මත කොන්ක්‍රීට් ස්ලැබ් ඇතිරීම හා ඉන්ද්‍රා මනම්පේරි මහත්මියගේ නිවස අසළ කොටසට පැති බැම්මක් ඉදි කිරීම.

**06:14 ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

06:14:01 හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ සෙල්වා මහතාගේ නිවස පිටුපස බැම්ම හා ඉහළ මාර්ගය සංවර්ධනය කිරීම.

**06:15 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06:15:01 ලේඩිස්මිත්වත්ත වැසිජල කාණු පද්ධතිය සැකසීම

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,613,690.73 |
| වෙනත් ලැබීම් | 8,378,861.46 |
| මුලු ලැබීම් | 18,992,552.19 |
| පුනරාවර්තන වියදම් | 12,807,220.60 |
| වෙනත් වියදම් | 3,730,936.73 |
| මුලු වියදම් | 16,583,157.33 |

**2020-12-01 දින සිට 2020-12-31 දක්වා ඉන්ධන වාර්තාව**

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 56-1906 | 24,960.00 |
| 227-5020 | 44,230.00 |
| | 750.00 |
| RD - 8240 | 24,859.68 |
| BC-0005 | 32,501.50 |
| 226-7521 | 13,520.00 |
| LL - 7688 | 13,520.00 |
| GC0001 | 6,606.00 |
| HF - 8558 | 20,800.00 |
| GK-6227 | 19,997.55 |
| CSM0009 | 1,064.00 |
| RC1107 | 26,663.40 |
| RC8183 | 27,560.00 |
| ND5124 | 37,112.40 |

| | |
|---|---|
| PF-4006 | 31,416.00 |
| RD 8000 | 5,200.00 |
| 37-7933 | 7,860.00 |
| FP 0002 | 4,620.00 |
| LL-2110 | 28,166.00 |
| RC 1118 | 36,938.00 |
| OV/M 0017 | 4,110.00 |
| UQ - 1933 | 1,370.00 |
| MG0014 | 22,631.44 |
| VI1833 | 2,740.00 |
| ZA 5039 | 71,893.12 |
| DDR 0008 | 1,985.85 |
| **එකතුව** | **513,074.94** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

තාවකාලික සභාපතිවරයෙක් පත්කිරීම සම්බන්ධව ඇතැම් අය හරියාකාරව වටහා නොගැනීම පිළිබඳ කණගාටුව පළ කරන බවද සමහරු මාධ්‍යවේදීන්ට දොස් කියන නමුත් ඔවුන් පළ කරන්නේ අපි ප්‍රකාශ කරන දේ බව ද මේ දිනවල සමාජ මාධ්‍යවල කැළඹීමක් පවතින අතර මාධ්‍යවේදීන්ගේ වැරැද්දක් නොදකින අතර ඔවුන් සභාවේ ප්‍රකාශ කළ දේ පළ කරන බවද මාධ්‍යවේදීන් යම් අපහසුතාවයකට පත්වූයේ නම් සභාව වෙනුවෙන් කණගාටුව පළ කරන බවද තම ඉල්ලීම්, බල අරගලය අසාධාරණය නොවන බවද තම පක්ෂය ජයග්‍රහණය කළ සභාවේ බලය ඉල්ලා සිටින බවද එහි නීත්‍යානුකූල පැත්ත මානුෂික පැත්ත හා ජනතාව කාටද බලය ලබා දුන්නේ යන්න බලා කටයුතු කරන බවද පැවසීය.

එමෙන්ම සභාවේදී ඉදහිට ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් තුල තමන් සිටින බවද අද දින සභාවේදී සෞඛ්‍ය කමිටුවේ සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා යෝජනා කිරීම පිළිබඳ ගැටලුවක් නොමැති බවද තමන් ස්වාධීනව සිටින බවද නිමල් කරුණාරත්න මන්ත්‍රීතුමා 2002 දී අපේක්ෂකයෙක් ලෙස තේරීම සඳහා තමන් දායක වූ බවද සභාපතිකම තේරීමේදී අහවල් කෙනාට නොදුනහොත් තමන් චමිකට ඡන්දය

ලබා දෙන බවට නිමල් කරුණාරත්න මන්ත්‍රීතුමා පැවසූ බවද එය ප්‍රශ්නයක් නොවන නමුත් මෙතන යම් කිසි කුමන්ත්‍රණයක් සිදු වන බවද එම කුමන්ත්‍රණවලට ජයග්‍රහණය කිරීමට තමන් ඉඩ නොදෙන බවද එමෙන්ම ලක්ෂ 5 යෝජනාවේදී නිමල් කරුණාරත්න මන්ත්‍රීතුමා ඡන්දය දීමෙන් වැළකී සිටිය අතර එය එසේ සිදුවිය නොහැකි බවද ඒවා නිවැරදි විය යුතු බවද කණ්ඩායමක් ලෙස එකට සිටිය යුතු බවද පවසන ලදී.

විශේෂයෙන්ම බළන්ගොඩ නගර සභාවේ කවුරුන් සභාපති ලෙස සිටියද සභාව ඉදිරියට කරගෙන යා යුතු බවද ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ විමලසේන මැතිතුමා මුදල් කමිටුවේ රුපියල් ලක්ෂ 5 දක්වා ගෙවීමේ යෝජනාව පිළිබඳ අදහස් දැක්වීමේ දී මුදල් කමිටුවට එම බලය ලබා නොදීම නිසා තමන්ට ජනතාවට සේවය කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කළ නමුත් එතුමාගේ කාලයේදී මුදල් කමිටුවට එම බලය ලබානොදුන්නද කිසිඳු සංවර්ධන කටයුත්තක් අඩාල නොකළ බවද මෙම අවස්ථාවේදී එතුමා සිටියානම් හොඳ බවද පැවසීය. එතුමා තමන්ට සභා වාර්තා හා පනත කියවා පැමිණෙන ලෙස පැවසූ බවද තමන් පනත අනුව වැඩ කටයුතු කරන බවද බොහොම සාධාරණ හා විවෘත බව පැවසූ නමුත් මෙම පනත උල්ලංඝනයේ කළේ එතුමාම බව තමන් විශ්වාස කරන බවද අයවැය සම්මත බවට පවසා සභාව ඉදිරියට කරගෙන යාමට විරුද්ධ බවද නීතිපති මතය විමසීමෙන් අනතුරුව නැවත එතුමාම සභාපති වුවහොත් තමන් එය අවංකව පිළිගන්නා බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා ඒ හේතුවෙන් තමන්ට කථා කිරීමට යෝජනා කිරීමට හා තර්ක කිරීමට පුළුවන් බවද ඒවා ගැන කොතරම් වාද විවාද කළද එතුලින් ජනතාවට සැලසෙන සෙත මොකක්දැයි බැලිය යුතු බවද එහි ප්‍රතිඵලයට නොව හේතුව කුමක්දැයි විමසන ලදී. යම්කිසි ඵලයක් හට ගන්නා විට එය හට ගැනීමට හේතුව කුමක්දැයි සොයා බැලු අතර එයට හේතුව සොයාගත් බවද එනිසා හේතුවට පිළිතුරු සොයා ගත යුතු බවද අද දේශපාලඥයින්ට මඩ ගහන බවද සමහර දේශපාලඥයින් වැරදි නොකරන නමුත් සමහරු තමන්ට තමන්ව පාලනය කර ගැනීමට නොහැකිව භාවිතා කරන වචන නිසා අදවන විට සිරකරුවෝ බවට පත්ව සිටින බවද එනිසා වැරදිකාරයින්ට දඬුවම් ලබාදිය යුතු බවද තම ආණ්ඩුව කරන සැමදේම හරි කියලා පිළිනොගන්නා අතර වැරදි දේ වැරදි බව ප්‍රකාශ කරන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා පාර්ලිමේන්තුවේ කිසිඳු හරයක් නොමැති දේවල් කථා කරන බවද නිර්මාණශීලි අදහස් නොමැති බවද නිර්මාණශීලි අදහස් පවතින අයට අවස්ථාව ලබා නොදෙන බවද පවසන ලදී. එමෙන්ම මේ දිනවල රන්ජන් රාමනායක ගැන විවිධ අදහස් සමාජයෙන් එල්ලවන අතර සමහරු රන්ජන් රාමනායක නිවැරදි බවත් සමහරු රන්ජන් රාමනායක වැරදි බවත් පවසන බව ද රන්ජන් රාමනායක යනු හොඳ

පුද්ගලයෙකු වන අතර ඔහු කථා කළ දේවල් සත්‍යය බව ද හොරුන්ට ඔහු කථා කරන දේවල් නිසා රිදෙන බවද රන්ජන් රාමනායක නිර්දෝශී පුද්ගලයෙක් බව ද පැවසීය.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා පාර්ලිමේන්තුවේ සිටි දුමින්ද සිල්වා මැතිතුමා ද වෙඩි වැදී එතුමාගේ ධනවත් කම නිසා ජීවිතය බේරාගත් නමුත් එතුමාට මේ වන විට මරණ දඬුවම නියම වී ඇති බවද අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමාට නිදහස ලබාදී සාධාරණයක් ඉටු කරනු ඇති බවට තමන් බලාපොරොත්තු වන බවද පැවසීය. එමෙන්ම හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රෝයල් පාර්ක් නඩුවේ වැරදිකරු නිදහස් කළ අයුරින් නොව ජනතාවට හේතු කාරණා විනිවිද ලෙස ඔප්පු කර නිදහස ලබා දිය යුතු බවද එසේකළහොත් මෙම රජයට තමන් ස්තූතිවන්ත වන බවද පවසමින් අද දින කාගේ හෝ සිත රිදුනනම් පවසන ලෙසද තමන් හරි දේ කතා කරන අතර කොන්ද කෙළින් තියාගෙන කථා කරන බවද තමන් කිසිඳු ප්‍රශ්නයකට නොසැලෙන බවද තමන් ඒවායින් පැන නොයන බවද ඕන ප්‍රශ්නයකට මුහුණ දෙන බවද ඕන කෙනෙකුට සීමාවෙන් පිට උදව් කිරිමට සූදානම් බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා ප.ව.01.02 ට සභාවෙන් පිටවන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූ දේ වෙනුවෙන් තම කණගාටුව පළ කරන බවද හිටපු සභාපති චමික ජයමිණ විමලසේන මැතිතුමා වෙත තම මනාපය ලබාදෙන බවට ප්‍රකාශ කර ඇත්තේ කොහේදැයි පෙන්වන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා**

සභාපතිවරයා සභාපති ධූරයෙන් නෙරපා හැරියේ අප කාගෙවත් උවමනාවෙන් නොව එය ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් බවද එතුමා පනත ප්‍රකාරව පළාත් පාලන අමාත්‍යවරයෙක් නොමැති නිසා එතුමාට ඇති බලතල අනුව එය කළ බවද එහිදී උප සභාපති සභාපති ලෙස පත්වන්නේ රට තුළ පවත්නා නීතිය අනුව බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවේ ගරු මන්ත්‍රීවරියක් සමාජ මාධ්‍ය තුළ තම්බියෙක් සභාපති කළ බවට මඩ ප්‍රහාර එල්ල කර ඇති බවද 2018 වර්ෂයේදී තම්බියෙක් උප සභාපති කළ නිසා මෙම අවස්ථාවේදී තම්බියෙක් සභාපති වුණේ යැයි ද බල තණ්හාවට තම්බියෙක් සභාපති කළ බවට එහි සටහන් වන නමුත් 2018 දී තම්බියෙක් උප සභාපති

කළේ බල තණ්හාව නිසා බව ද පැවසිය. එබැවින් ඕනෑම විවේචනයක් මෙම සභාවේදී කරන ලෙසත් සමාජ මාධ්‍ය තුළ ප්‍රසිද්ධ කිරීම සුදුසු නොවන බවත් තම්බියෙක් සභාපති කළේ අපි නොව එම ප්‍රකාශ කියන අයම බවත් වැඩිදුරටත් පැවසීය.

අනතුරුව මේ සම්බන්ධව මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු සභාව තුළ අදහස් දැක්විම නිසා සභාවේ ඝෝෂාකාරී බවක් ඇති විය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.පේමදාස මැතිතුමා**

ලෝකයේ මිනිස්සු පටන් ගත්තේ එකම මූලයකින් බවද ඉන්පසුව විවිධ ආගම් අදහන අතර විවිධ භාෂා කථා කරන බවද ඉස්ලාම් භක්තිකයෙක් වූ පමණින් මෙතුමා මෙම පුටුවේ වාඩි වීම නුසුදුසු දැයි විමසන ලදී. මෙය අපි සිතන විදිහේ වැරැද්දක් බවද ඉන්දියාවේ මන් මෝහන් සිං සිග් ජාතිකයෙක් වූ නමුත් එතුමා ජනාධිපති වූ බවද එම රටේ සිග් ජාතිකයින්ගේ නියෝජනය 4% ක් බවද එබැවින් ඉස්ලාම් භක්තියෙකුට මෙම පුටුවේ වාඩිවීමට අයිතියක් නැද්ද යනුවෙන් විමසූ අතර අපි ජාතියක් ලෙස ඉතාම පහත් තැනක සිටින බවද මහ ලොකුවට බෞද්ධයෝ යැයි පවසන බවද පැවසීය. බුදු හාමුදුරුවන්ගෙන් **වාසෙස්ටි භංගං** එනම් ස්වාමීණී ජාතිය යනු කුමක්දැයි අහන බවද එහිදී බුදුරජාණන් වහන්සේ උඩ ඉගිලෙන පක්ෂීන් එක ජාතියක් බවද කැලේ සිටින සිව්පාවුන් යනු එක් ජාතියක් බවද මිනිස්සු යනු එක ජාතියක් බවද කථා කරන භාෂාව, ආගම සංස්කෘතිය වෙනස් වීම මෙවැනි පුටුවක වාඩි වීමට නුසුදුසු කමක් නොවන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ. පේමදාස මැතිතුමා ඉතිහාසයේ මෙවැනි සිදු වීම් ගණනාවක් වූ බවද ආසියාවේ පහළ වූ හොඳම දේශපාලඥයෙක් වූ ලක්ෂ්මන් කදිරගාමර් මහතා ව අගමැති ලෙස පත්කිරීමට සූදානම් වූ නමුත් ඔහු සුළු ජාතිකයෙක් වීම නිසා එම අවස්ථාව නොලැබුණු අතර බණ්ඩාරණායක මැතිතුමාගෙන් පසුව ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ සභාපතිත්වය දරා ලංකාවට පැමිණි චන්ද්‍රිකා බණ්ඩාරණායකගේ ආණ්ඩුවේ විදේශ කටයුතු ඇමති ලෙස විශාල වැඩ කොටසක් ඉටු කළ බවද මේ රට තුළ ඇති බරපතලම ඛේදවාචකය මෙය බව ද මෙවැනි තත්ත්වයක් තුළ සුළු ජාතිකයෙකුට කවදාවත්ම රටේ වෙනත් ආගමක් අදහන වෙනත් භාෂාවක් කථා කරන කෙනෙකුට රටේ ඇමති කෙනෙකුගෙන් ඉහළට යා නොහැකි බවද සභාවක නම් උප සභාපති ධූරයෙන් ඉහළට යාමට නොහැකි බවද මේ පවසන්නේ යනුවෙන් විමසන ලදී. මෙවැනි සභාවක මෙවැනි දේවල් කථා කිරීම ලැජ්ජා සහගත බවද සමාජ මාධ්‍යවල මෙවැනි දේ කතා කිරීම සුදුසු නොවන බවද මෙතුමා ඉස්ලාම් භක්තිකයෙක් බැවින් එතුමාට අකමැතිනම් සභාවේ යෝජනා සජීර කර මෙතුමා ඉවත් කළ හැකි බවද පනත පරිදි මෙතුමා සභාපති

වූ බවද බොහෝ සභාවල් වල එකම කණ්ඩායමක් විසින් සිදු කරන කාලගෝට්ටි දැක ගත හැකි බවද බළන්ගොඩ නගරය ගත් විට මුස්ලිම් දෙමළ සිංහල ජනවර්ග තුනම ජීවත් වන බවද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා නිවැරදි අදහස් කිහිපයක් ප්‍රකාශ කළ අතර ලක්ෂ 69 ක් දීපු ඡන්ද කෙමෙන් කෙමෙන් බාදනය වන බවත් විශාල බලයක් ලැබුණු පසු එසේ සිදුවන බවත් එතුමා පැවසූ අතර එසේ බලය ලබා ගත් ට්‍රම්ප් ඊයේ ගෙදර ගිය බවද ජාතිවාදය ආගම්වාදය අවුස්සා බලය ලබා ගන්නා ඕනෑම අයෙකුට අත්වන ඉරණම එය බවද මේ වන විට ඉන්දියාව තුළ ගොවි ජනතාව ජනාධිපතිට විරුද්ධව විශාල අරගලයක් ගෙන යමින් සිටින බවද එබැවින් තාවකාලිකව ජයග්‍රහණය කිරීමට හැකි නමුත් එම ජය දිගුකල් පැවතිය නොහැකි බව ද පවසන ලදී. පසුගිය දිනෙක ඇමරිකාවේ පත්වූ ජනාධිපතිවරයා ප්‍රජනතන්ත්‍රවාදය ලෝකය ගැන හොඳ දෘෂ්ටියක් තිබෙන ජනාධිපතිවරයෙක් පත් වූ අතර ඉන්දීය සම්භවයක් ඇති කාන්තාවක් උප ජනාධිපති ලෙස පතවූ බවද එම උප ජනාධිපතිවරියගේ ලේකම් ලෙස පත්වූයේ ශ්‍රී ලංකාවේ දෙමල සම්භවයක් ඇති තරුණියක් බවද එබැවින් මෙතෙක් කාලයක් ආසියාවට එල්ලවූ බාධක නොමැති වන බවද ජාත්‍යන්තර වශයෙන් ඇමරිකාව එල්ල කළ බලපෑම් ලිහිල්වනු ඇති බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී පේමදාස මැතිතුමා එතුමාගේ කථාවට මුල් කර ගනුයේ එතුමාගේ පක්ෂයේ නායකයාගේ කථාව බවද එනම් ලැජ්ජයි ලැජ්ජයි ලැජ්ජයි යනුවෙන් බවද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා කථා කළ දේ සත්‍යය බවද උප සභාපතිතුමා සභාපති වූ අවස්ථාවේදී සමාජ මාධ්‍යවල පළ වූ දේ තමන් දුටු බවද පොදුජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යනු එක් පක්ෂයක් බවද පැවසීය. එනමුත් පක්ෂ දෙක අතර යම් එකඟතාවයකට පැමිණීමට නොහැකිව පක්ෂ දෙකක් ලෙස ඡන්දය ඉල්ලූ බවද නියම පරමාධිපත්‍ය පොදුජන පෙරමුණට තිබිය යුතු බවද එම පක්ෂය කොට්ඨාශ 10න් කොට්ඨාශ 7ක් ජයග්‍රහණය කළ ද විකෘති ඡන්ද ක්‍රමය නිසා බහුතරය හිමි නොවූ බැවින් එම අවස්ථාවේදී ආසන සංවිධායකතුමා හා පක්ෂ නායකතුමාගේ තීරණය අනුව එක්සත් ජාතික පක්ෂය සමඟ එක්ව ආණ්ඩුව පිහිටවූ අතර සභාවේ උප සභාපති ධූරයද ආසන සංවිධායකගේ ඉල්ලීම අනුව සිදු වූ බව පැවසීය. එමෙන්ම බළන්ගොඩ නගරයේ වැඩිම ඡන්ද ප්‍රමාණයක් මුස්ලිම් ඡන්ද වන අතර මනාප ක්‍රමයට සභාපති පතවූයේනම් සැමදාම පත්වන්නේ මුස්ලිම් සභාපතිවරයෙකු බවද තමන් මුස්ලිම් ජනතාව වැඩියෙන් ආශ්‍රය කරන බවද අද වන විට ආණ්ඩු එහාට මෙහාට පෙරලන්නේ සුලු

ජාතික ජනතාව නිසා බවද එදා සභාපතිවරයා හරියට ධූරයේ සිටියේ නම් අදටත් සභාපති ධූරයේ සිටින බවද සභාපතිවරයා හිතුමනාපයට බඳවා ගැනීම් සිදු කළ බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා පොදු වෙළෙඳසැල් භාරකරු නිසි තනතුරේ යොදවන ලෙසද ඉරිදා පොළ සඳහා නිළධාරීන් 6 දෙනෙකු යොදවා ඇති බවද සභාවේ නිළධාරීන්ට බලතල පවරා නොමැති බවද නිළධාරීන් නිත්‍ය තනතුරේ රාජකාරි සඳහා යොමු කරන ලෙසද ඉරිදා දිනවල බළන්ගොඩ අවට පැවැත්වෙන මහජන පොළවල් වසා තබන බැවින් එම සියලු වෙළෙන්ඳන් බළන්ගොඩ මහජන පොළට පැමිණෙන බව ද ඒ පිළිබඳ තිරණයක් ගන්නා ලෙසද පැවසීය.

ඉදිරියේදී පොදුජන පෙරමුණ සමඟ එක් වී එම පක්ෂයේ සභාපතිවරයෙකු පත්කිරීමට සිදුවන බව ද උප සභාපතිවරයාට අවශ්‍ය මේසය පුටුව ලබා ගත්තේ සභාවේ මන්ත්‍රීවරු කථාකිරීමෙන් අනතුරුව බවද ගරු සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ගුරුවරයෙක් වන අතර අත්දැකීම් බහුල පුද්ගලයෙක් බවද හිටපු මහජන සෟඛ්‍ය පරීක්ෂක, වැඩ අධිකාරි හා ආදායම් පරීක්ෂක තුමා සභාවේ කාර්යයන් සඳහා සහභාගිකර ගැනීමට හැකියාවක් තිබේනම් එය අනුමත කරන බවද මෝටර් ග්‍රේඩරයේ රියදුරුගේ දීමනාව අනුමත නොකළේ ඒ පිළිබඳ විස්තර නිසි ලෙස පැහැදිලි කිරීමට නොහැකි වූ නිසා බවද ගරු සභාපතිතුමාට ඉදිරියේදී සහයෝගය ලබා දෙන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා නිදහස් පක්ෂයේ සාමාජිකයෙකු වුවද මේ වන විට තම කණ්ඩායමේ සාමාජිකයෙකු බවද එනිසා ගරු සභාපතිතුමාට අවශ්‍ය සහයෝගය ලබා දෙන බවද තමන් හිටපු සභාපතිවරයාටද අවශ්‍ය සහයෝගය ලබා දුන් නමුත් එතුමා තමන්ගෙන් වැඩ ලබා ගැනීම සිදු නොකළ බවද තමන් පනත තේරුම් ගනිමින් කටයුතු කරන බවද පොළ කඩ ප්‍රමාණය තව වැඩි කිරීම, විදුලිය ලබා දිම කරන ලෙස ද තමන් මෙම ස්ථානයට පැමිණියේ සේවය කිරීම සඳහා බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

කෙටි කාලයකට හෝ සභාපති ධූරයට පත් වූ ගරු සභාපතිතුමා වෙත අවංකව සුභ පැතුම් එක්කරන බවද එම කාලය තුළ ජනතාවට අවශ්‍ය සේවය ඉටු කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන අතර සියලු

සභිකයින් බළන්ගොඩ නගරයේ ජීවත්වන ජනතාව වෙනුවෙන් සේවය කිරීම සඳහා බැඳී සිටින බව ද ජාති කුල භේද කිසි දෙයක් අදාළ නොවන බවද ගරු සභාපතිතුමාගේ සහයෝගය සභිකයින් වෙත දක්වන ලෙසද ගරු සභිකයින්ගේ සහයෝගය සභාපතිතුමාට ද ලබා දෙන බවද සඳහන් කරමින් ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

තමන් ගරු සභාපතිතුමාට සුභ පැතුම් එක් කරන බව ද සම්බන්ධීකරණ කමිටුව සඳහා මුගුණමලේ කුඹුරු ඉඩම් ගොඩ කිරීම සම්බන්ධව යොමු කිරීමට සාකච්ඡා කළ බැවින් එය මෙවර සභාව තුළින් සම්බන්ධීකරණයට යොමු කරන ලෙසද මුගුණමලේ පාරට ලංකර වැටවල් ගසන බැවින් එය වැළැක්වීමට කටයුතු කරන ලෙසද කාර්පාක් අංක 6 කඩ කාමරය ලබාදීමේ දී සිදුවී ඇති අක්‍රමිකතාවය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

සමාජ මාධ්‍යවල පළ වූ අදහස් පිළිබඳ අදහස් දැක්වීමක් කල අතර තමන් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පළකළ අදහසට ප්‍රතිචාරයක් දැක්වූ බවද සභාවේ මන්ත්‍රීවරුන් සිදුකළ දේ නිසා සභාපතිත්වය අහිමි වූ බවද එවැනි දෙයක් සිදු නොවූයේනම් මේවන විටත් එතුමා සභාපති ධූරයේ සිටින බවද තමන් ජාති කුළ ආගම් භේද නොතකන බවද හිටපු සභාපතිවරයා තරුණ දක්ෂ සභාපතිරයෙක් බවද එතුමා මෙම මුහුණ දුන් ගැටළුව පිළිබඳ කණගාටුව පළ කරන බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී විමලසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමාට සුභ පැතුම් එක්කරන අතර 2015 දී ආණ්ඩු පෙරළිය සමඟ සිදුවූ විපර්යාසය නිසා සිදු වූ දෙයින් මෙය සිදු වූ බවද 2018 වර්ෂයේ පළාත්පාලන මැතිවරණ ක්‍රමය මගින් ඡන්ද පදනම මත මන්ත්‍රීකම් බෙදී ගිය බවද එහිදී නිදහස් පෙරමුණ එක්සත් ජාතික පක්ෂය සමඟ එකවූ බවද එහිදී වත්මන් සභාපති උප සභාපති ලෙස පත්වූ බවද මෙලෙස මෙතරම් ඉක්මනින් නැවත බල පෙරළියක් වේ යැයි කිසිවෙකු නොසිතූ බවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පොදුජන පෙරමුණ එක්ව බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණයේ යම් කිසි ප්‍රතිඵලයක් ලෙස මෙය සිදු වූ බවද දේශපාලනයේ හැටි මෙහෙම තමයි කන වෙලාට කබරගොයා තලගොයා වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු සභාපතිවරයාට ධෛර්ය ශක්තිය ලැබේවායි සුභ පැතුම් එක් කළ අතර තමා හා පක්ෂයේ පූර්ණ සහයෝගය එතුමාට ලබා දෙන බව පවසන ලදී.

එමෙන්ම අද දින සභාවේ සිදු වූ සිද්ධිය පිළිබඳ කණගාටුව පළකරන බව ද ජනතාවට සේවය කිරීම සඳහා පැමිණි අතර සභාවට තව කාලය ඇත්තේ වසරක් පමණක් බවද මෙම කාලසීමාව තුළ බළන්ගොඩ ක්‍රීඩාංගණය, මහජන පොළ ආදී විශාල සංවර්ධන කටයුතු සිදු කිරීමට ඇති බවද ආදායම් උත්පාදන කටයුතු සිදු කිරීමට ඇති බවද ඒ සියලු දේ සියලු දෙනා එක්ව සහයෝගයෙන් කළ යුතු බවද පවසන ලදී. එවිට මෙම සභාව පැවති කාලය තුළදී පක්ෂය නොබලා ජනතාවට සේවය කිරීමට හැකි වූ බවට සතුටු විය හැකි බවද කාපට් කිරීමට නියමිත මාර්ග වල විදුලි කණු හා දුරකථන කණු ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසද සුභ නව වසරක් වේවා මෙන්ම නව සභාපතිතුමාට ජයෙන් ජයම වේවා යි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය**

නව සභාපතිතුමාට සුභ පැතුම් එක් කළ අතර, කුමාරගම බෙත්තාරාම පන්සල අසල පැති බැම්ම කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය පිළියමක් යොදන ලෙස පවසන ලදී.

**11. අවසානය**

මාධ්‍යවේදීන්ට සභාව තුළට පැමිණෙන ලෙස පවසා සිටියේ මාධ්‍ය තුළින් කෙනෙකු ඉහළම තැනට ගෙන යාමට මෙන්ම තවත් කෙනෙකු පහළම තැනට හෙළීමට හැකියාවක් පවතින බැවින් බව පැවසූ ගරු සභාපතිතුමා මාධ්‍යවේදීන්ට හා මන්ත්‍රීවරුන්ට තමා පවසා සිටින්නේ තමන්ගේ ජාතිය වන්නේ රටට ආදරය කරන ජාතිය, ශ්‍රී ලංකා මාතෘ භූමියට ආදරය කරන ජාතිය, බළන්ගොඩ ජනතාවට ආදරය කරන ජාතිය බවයි. එම නිසා වෙනත් ජාති භේදයක් තමා තුළ නොමැති බවද තමා වසර 30 ක පළ පුරුද්දක් ඇති ක්‍රීඩා ගුරුවරයෙකු වන අතර ජය පරාජය, ඉවසීම, අත්දැකීම්, දරා ගැනීමේ ශක්තිය තමාට පවතින බවද 2006 දී බළන්ගොඩ ජනතාවට සේවය කිරීම සඳහා නගර සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස පත්වූ බවද එසේ පත්වූ අවස්ථාවේදී සිංහල ජනතාවගේ ඡන්ද 90% ක් පමණ ලැබුණු බවද අදටත් එම ආදරය එසේම පවතින බවද තමන්ද එසේම ජනතාවට ආදරය කරන බවද පැවසීය.
එමෙන්ම එදා සිට නගර සභාවේ උප සභාපතිවරයෙක් වීමට බලාපොරොත්තුවක් තමාගේ තිබුණ බව ද එනිසා 2018 වර්ෂයේදී හිටපු සභාපතිතුමා සමග සටන් කර උප සභාපති කම ලබා ගත් බවද එම අවස්ථාවේදී එය ලබා ගත්තේ එතුමා සමඟ වෛරයෙන් නොවන බවද එතුමා තුන්වරක් නගර සභාවේ සභාපති ලෙසත් විපක්ෂ නායක ලෙසත් සිටි බවද එබැවින් එතුමාගේ ආශිර්වාදයෙන් තමන්ගේ දේශපාලන ගමන මෙතරම් දුරක් පැමිණි බවද එම පන්නරය තුළින් තමන්ට මෙම ස්ථානයට ඒමට

බලාපොරොත්තුවක් තිබූ බවද පැවසූ ගරු සභාපතිතුමා අබුසාලි මැතිතුමාට පසුව නීත්‍යානුකුල ලෙස සභාවේ සභාපති වශයෙන් එක් දිනක් හෝ පත්වීමට තමාගේ අධිෂ්ඨානයක් තිබූ අතර අද දින තමන් ගොඩක් සතුටු වන බවත් අනෙක් මන්ත්‍රීවරුන්ටද එසේ බලාපොරොත්තුවක් තිබිය යුතු බවත් පැවසීය. තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුවේ මෙම ස්ථානයට පැමිණ ඇත්තේ මහජනතාවට සේවය කිරීම සඳහා බවද අප එසේ ඉටු නොකරන්නේ නම් ඊළඟ ඡන්දයේදී ගෙදර යා යුතු බවද ඒ සඳහා ඇමරිකානු ජනාධිපතිතුමා උදාහරණයට ගත යුතු බවද තමා තුළ කවදාවත්ම ජාති භේද පක්ෂ භේද ආගම් භේද කුල භේද නොමැති බවද හිටපු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා තමන් දේශපාලනයට ගෙන ආ බවද අවුරුදු 17 ක් අබුසාලි මැතිතුමාට දේශපාලනයේ සිටීමට ඡන්දය ලබා දුන් අයගෙන් 99% ක් ලබා දුන්නේ සිංහල ජනතාව බවද පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී අකිල සාලිය එල්ලාවල මැතිතුමා දිනවීම වෙනුවෙන් කටයුතු කළ බවද තමන් තුළ ජාති භේද නොමැති බවද තමන් කිසි දිනෙක මෙම සභාවේ සභාපතිකම නොඉල්ලූ බවද කිසිදු මන්ත්‍රීවරයෙකුට වෛර කර නොමැති බවද පැවසීය. එමෙන්ම තමන්ගේ අඩුපාඩුවක් කවුරුන් හෝ පෙන්නුවහොත් එය පිළිගන්නා බවද තමන් අතින් වැරද්දක් සිදුවූයේ නම් ඕනෑම අයෙකුගෙන් සමාව ඉල්ලා සිටින බවද එය තමන්ගේ පුරුද්දක් බවද තම දෙමාපියන් තමන් හට පුරුදු කර ඇත්තේ එසේ බවද තමන් ජීවත් වන පරිසරය අනුව එසේ පුරුදු වී ඇති බවද පැවසූ ගරු සභාපතිතුමා, ආණ්ඩුකාරතුමා විසින් හිටපු සභාපතිතුමා වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇති අතර එම චෝදනා පත්‍රයෙන් හිටපු සභාපතිතුමා නිවැරදිනම් නැවත එතුමාට සභාපති වීමට හැකි බවද තමන් සභාපති ලෙස වැඩ භාර ගන්නා අවස්ථාව සඳහා සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් කිසිඳු මන්ත්‍රීවරයෙකුට ආරාධනා නොකළ අතර එම අවස්ථාවට ආරාධනා කළේ හිටපු සභාපති චමික වැවේගෙදර මැතිතුමාට පමණක් බවද තමන්ට දේශපාලන භේදයක් නොමැති බවද ගරු කළ යුතු සියලු දෙනාට ගරු කරන බවද සමහර විට මෙය තමන්ගේ අවසාන සභාව විය හැකි බවද පරීක්ෂණය අවසන් වීමෙන් අනතුරුව සභාපති පත් කරන අවස්ථාවේදී සභපති ලෙස සුදුසු කෙනෙකු පත්කිරීමට තම සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවද තමන් පළමු ශ්‍රේණියේ ගුරුවරයෙකු බවද තමන් මෙම ස්ථානයට වඩා එයට ප්‍රිය කරන බවද පවසන ලදී. එබැවින් මහත්මා ගතිය ගරුත්වය මන්ත්‍රීවරුන්ගෙන් මෙන්ම සමාජයෙනුත් බලාපොරොත්තු වන බවද තම සම්පූර්ණ සහයෝගය හිමිවන බවද සමඟිය අවශ්‍ය නමුත් මතභේද තිබිය හැකි බවද එකිනෙකා අතර වචන හුවමාරු කිරීමේදී අනෙකාගේ සිත රිදවීම සුදුසු නොවන බවද දේශපාලන ගමනේ මිතුරන් මෙන්ම හතුරන් නොමැති බවද පවසන ලදී.

එමෙන්ම තමන්ට ස්වාධීන තීරණයක් ගත නොහැකි බවද තම පක්ෂයේ මතයට ගරු කළ යුතු බවද 2018 වර්ෂයේදී පක්ෂයේ තීරණය අනුව එක්සත් ජාතික පක්ෂය සමඟ එක් වූ අතර එය ඉහළින් ලැබූ තීන්දුවක් බවද අතිගරු ජනාධිපති ලෙස ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පත් වූ පසු තම පක්ෂය පොදු ජන පෙරමුණ සමඟ එක් වූ බවද හෘද සාක්ෂියට අනුව එය වැරදි වීමට පුලුවන් වුවද දේශපාලනය කරනනේනම් පක්ෂ නායකත්වයට ගරු කළ යුතු බවද සමඟිව කටයුතු කළ යුතු බවද මිනිසුන්ගේ හිත රිදවීම නොකළ යුතු බවද දේශපාලකයින් ගන්නා තින්දු තීරණ වලට සෑම විටම සභාවේ නිළධාරීන් වගකිවයුතු බවද පැවසූ ගරු සභාපතිතුමා මේ නිසා නිළධාරීන් පීඩාවට පත්වන බවද නිළධාරීන් සතුටින් වැඩ කරන්නේනම් ජනතාවට සතුටින් සේවය ලබාදීමට හැකි බවද එබැවින් රාජ්‍ය සේවකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවද මන්ත්‍රීවරුන් වෙනුවෙන් තමන් පෙනී සිටින බවද සියලුම සේවාවන් අවශ්‍ය පරිදි ඉටු කරන බව ද පවසන ලදී.

අද දින සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය, මාධ්‍යවේදීන් සඳහා ස්තුතිය පළ කරමින් අද දින සභාවේ කටයුතු ප.ව.3.00ට පමණ අවසන් විය.

එම්.ටී.එම්.රුමි,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.